www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය ජනාධිපතිවරන අපේක්ෂකයා නිවේදනය කරයි

## Sri Lankan SEP announces presidential candidate

සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශයකි
2009 දෙසැම්බර් 09

ලබන වසරේ ජනවාරි 26 දින පැවැත්වෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය සඳහා සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ප්‍රධාන ලේකම් විජේ ඩයස් ඉදිරිපත්වේ. වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව අඛන්ඩව එල්ල කෙරෙන ප්‍රහාරයන්ට විරුද්ධව සටන් කිරීම සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය බලමුලු ගැන්වීමට මැතිවරනය සඳහා ඉදිරිපත්ව සිටින්නේ සසප පමනි.

උග්‍ර දේශපාලන හා ආර්ථික අර්බුදය මධ්‍යයේ වසර දෙකකට කලින් මැතිවරනය කැඳවා තිබේ. ජනාධිපති මහින්ද රාජපක්ෂ, තම ආන්ඩුවේ ඒකාධිපති පාලන විධීන් හා උත්සන්න වන සමාජ අර්බුදය පිලිබඳ වගකීම වෙතින් අවධානය ඉවතට හැරවීම සඳහා මැයි මාසයේදී එල්ටීටීඊය පරදවා ලත් මිලිටරි ජයග්‍රහනය ගසාකෑමට මාන බැලීය. මැතිවරනය ප්‍රමාද වූයේ නම්, ආර්ථිකයේ තත්වය වඩවඩාත් නරක අතට හැරීමේ තතු තුල රාජපක්ෂට යලි බලයට ඒමේ අවස්ථාව අවදානම් සහගත වී තිබුනි.

ජනාධිපති ගනන් බැලුවේ බෙදී ගිය විපක්ෂයකට මුහුන දීමටය. ඔහු ඒවන විටත් විරුද්ධ පක්ෂ තීරනාත්මක ලෙස පරාජය කල පලාත් සභා මැතිවරන මාලාවක් තුලින් තත්වය උරගා බලා තිබුනි. ආන්ඩුව ජය වාර්තා කලේ එයට පලල්ව පැවැති ජනප්‍රියතාවක් නිසා නොව එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) කිසිදු විකල්පයක් ඉදිරිපත් නොකල බැවින්ය. මෙම පක්ෂ දෙකම එල්ටීටීඊ විරෝධී වර්ගවාදී යුද්ධයට සහාය දුන්නා පමනක් නොව ඉන් එකකට වත් ආන්ඩුවේ වෙලඳපොල ගැති ආර්ථික න්‍යායපත්‍රය සමඟ කිසිදු මූලික මතභේදයක් නොවීය.

කෙසේ වෙතත්, තමන්ගේ ම අපේක්ෂකයන් ඉදිරිපත් කරනවා වෙනුවට එජාප හා ජවිපෙ, තමන්ගේ "පොදු අපේක්ෂකයා" ලෙස ජෙනරාල් සරත් ෆොන්සේකාට පිටුබලය සපයයි. පසුගිය මාසයේදී ඉල්ලා අස්වන තෙක්ම රටේ ඉහල ම ජෙනරාල්ව සිටි ෆොන්සේකා පසුගිය තෙවසර පුරාම රාජපක්ෂගේ යුද්ධය කුරිරු ලෙස ගෙනගියේ ය. තමන්ගේ ම "රන විරුවා" පෙරට ගෙන එමින් එජාප හා ජවිපෙ බලාපොරොත්තු වන්නේ, එල්ටීටීඊ පරාජය මත රාජපක්ෂ ගෙන යන ජයග්‍රාහී අඬහැරය නිහඬ කිරීම ය. එහෙත් ෆොන්සේකාගේ අපේක්ෂකත්වයෙහි සැබෑ අර්ථභාරය වන්නේ, ප්‍රථම වතාවට රටේ දේශපාලන ජීවිතය තුලට මිලිටරියේ සෘජු මැදිහත්වීමත් පාර්ලිමේන්තු පාලනය තව දුර කුනුවීමත් ඉන් සනිටුහන් කිරීමයි.

අන් සියලු අපේක්ෂකයන්ට එරෙහිව විජේ ඩයස්, සමාජවාදී පිලිවෙත් ඔස්සේ සමාජය ප්‍රතිසංවිධානය කිරීමේ ඉලක්කය ඇතිව කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් බලයට ගෙන ඒමේ අරගලය සඳහා සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් එකමුතු කරමින් ඒ පසුපස ගම්බද ජනතාව පෙලගැස්වීමේ උද්ඝෝෂනයක් ගෙනයනු ඇත. උතුරේ හා නැගෙනහිර හමුදා වාඩිලෑම වහාම නතර කල යුතු බවත්, යුද්ධය අවසන්වූ තැන් පටන් නීති විරෝධී ලෙස රඳවාගෙන සිටින දසදහස් සංඛ්‍යාත දෙමල සිවිල් වැසියන් කොන්දේසි විරහිතව නිදහස් කල යුතු බවත්, සියලු මර්දනකාරී අනපනත් හා හදිසි නීතිය අවලංගු කල යුතු බවත් සසප කියා සිටියි.

කවරෙක් මැතිවරනය ජයග්‍රහනය කලත් ඊලඟ ආන්ඩුව, වැඩ කරන ජනතාවගේ සමාජ තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට තවදුරටත් පහර දෙනු ඇතැයි සසප අනතුරු අඟවයි. 2005 වසරේ සිය ජනාධිපතිවරන ව්‍යාපාරය තුලදී සාමය ගෙන ඒමට පොරොන්දුවීමෙන් අනතුරුව රාජපක්ෂ, වැඩ කරන ජනතාව බෙදීමටත්, කඳුගැසෙන සමාජ හා ආර්ථික ගැටලු වෙතින් අවධානය ඉවතට හැරවීම සඳහාත් මාස කිහිපයක් තුල රට යලිත් යුද්ධයට ඇද දැමීය.

එනමුදු යුද්ධය පාලක පන්තිය මුහුනපා සිටින අර්බුදය ගැඹුරු කර ඇත. සිය යෝධ මිලිටරි පිරිවැය

ගෙවා ගැනීම පිනිස රාජපක්ෂ, කරවටක් දක්වා ම රට උකසට තැබූ නමුත් පසුගිය වසරේ ගෝලීය මූල්‍ය අර්බුදයත් සමග ඔහුට ලාබෙට ජාත්‍යන්තර නය ගැනීමට තිබූ අවස්ථාව අතුරුදහන් විය. ජාත්‍යන්තර ආර්ථික පසුබෑම දිවයිනේ අපනයන කෙරෙහි ද බලපෑවේය. උග්‍ර විදේශ සංචිත අර්බුදයක් මගහරවා ගැනීම සඳහා ආන්ඩුවට, ඩොලර් බිලියන 2.6 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් නයට ගැනීමට බලකෙරිනි.

දරුනු කප්පාදුවක් සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ ඉටු කිරීම සඳහා රාජපක්ෂ, රාජ්‍ය අංශය තුල රැකියා හා වැටුප් කැටිකිරීමක් මේ වන විටත් ක්‍රියාවට නගා ඇති අතර, පුද්ගලීකරනය තව දුරටත් ගෙනයමින් සිටියි. වඩාත් නරක තත්වය එලඹීමට නියමිත ය. මේ වසරේ අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9 සිට 7 දක්වාත් එලඹෙන දෙවසර තුල තවත් සියයට දෙකකිනුත් තියුනු ලෙස කැපිය යුතු බව මූල්‍ය අරමුදල නිර්දේශ කර තිබේ. මැතිවරනය අවසන් වන තෙක් 2010 වසරේ අයවැය කල් දැමීම මඟින් මේවායේ ඇඟවුම් ඡන්දදායකයන්ගෙන් වසන් කිරීමට රාජපක්ෂ තැත්කරයි.

ඊලඟ ආන්ඩුවට, රාජ්‍ය අංශයේ රැකියා, වැටුප් මෙන්ම අත්‍යවශ්‍ය සේවාවන් හා මිල සහන ද තියුනු ලෙස කපා හැරීමටත්, කුමන හෝ විරුද්ධත්වයක් පූර්න රාජ්‍ය බලය යොදා මැඬීමටත් බලකෙරෙනු ඇත. එලඹෙන්නට ඇති දේ ගැන කම්කරුවන්ට දැනටමත් කර්කශ අත්දැකීම් ලැබී තිබේ. ප්‍රෝඩාකාරී "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන කඩතුරාව යටතේ රාජපක්ෂ, හදිසි නීතිය පවත්වාගෙන ගියේය. ඔහු පසුගිය මාසයේ වැටුප් වැඩිවීමක් ඉල්ලා රාජ්‍ය අංශයේ වරාය, විදුලිබල, ජල සම්පාදන හා ඛනිජ තෙල් සංස්ථා කම්කරුවන් ගත් වෘත්තීය ක්‍රියාමාර්ගය නීති විරෝධී කිරීම සඳහා හදිසි නීතිය යොදාගැනීමත් සමඟ එහි සැබෑ අරමුන එලිමහනට පැමිනියේය. ආන්ඩුවේ හා ව්‍යාපාරිකයන්ගේ කාර්මික පොලිස්කාරයා ලෙස ක්‍රියාකරන වෘත්තීය සමිති වහාම උද්ඝෝෂනය අතහැරියේ ය.

වැඩ කරන ජනතාවට එරෙහිව පොලිස් මිලිටරි පියවර ගැනීමට රාජපක්ෂ කිසිසේත් ම නොපසුබට වෙතත්, පාලක පැලැන්තියේ සමහර කොටස්, ගොඩනැගෙමින් තිබෙන සමාජ පිපිරීම සමඟ පොර බැදීමට ඔහුගේ බිඳෙනුසුලු ආන්ඩුවට නොහැකි වනු ඇතැයි බියට පත්ව සිටිති. ඔවුහු, කිසිදු පක්ෂයකට අයත් නැති හා ඒ නිසාම කිසිදු පක්ෂ විනයකට හෝ පක්ෂ ක්‍රියාමාර්ගයකට බැඳී නැති බොනපාට්වාදී චරිතයක් වන ජෙනරාල් ෆොන්සේකා වෙත හැරී සිටින්නේ, අවශ්‍ය ආර්ථික පියවර පෙරට ගෙන යාමටත්, සියලු විරෝධතා නිර්දය ලෙස මැඬීමටත්ය.

තමන් ප්‍රජාතන්ත්‍රවාදීන් ලෙස පෙන්නා ගැනීමට රාජපක්ෂ හා ෆොන්සේකා දරන උත්සාහය කම්කරුවන් විසින් පිලිකුලෙන් යුතුව ප්‍රතික්ෂේප කල යුතුය. සිය ගනන් දෙමල ජනතාව ද මාධ්‍යවේදීන් හා දේශපාලන විරුද්ධවාදීන් ද පැහැරගෙන ගොස් මරාදැමීම සඳහා ඝාතක කල්ලි යොදාගැනීම ද ඇතුලු පසුගිය සිව් වසර තිස්සේ ආරක්ෂක හමුදා විසින් ගෙන යනු ලැබූ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීම් පිලිබඳව දැන් දෙදෙනාම එකිනෙකාට චෝදනා එල්ල කර ගනිමින් සිටිති. නීති විරෝධී මිනීමැරුම්වලට කිසිදු අයුරකින් ආරක්ෂක හමුදා සම්බන්ධ නොමැති බවට ඔවුන් දිව්රා සිටින නමුදු, මේවාට මෙන්ම අනෙකුත් අපරාධවලට ද දෙදෙනාම වගකිව යුතු වෙයි.

රාජපක්ෂ "බාල වර්ගයේ ආඥාදායකයෙක්" ලෙස හංවඩු ගසන ෆොන්සේකා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කල යුතුය යන විරුද්ධ පක්ෂවල ඉල්ලීමට කරගසාගෙන සිටියි. කෙසේ වෙතත්, රාජපක්ෂගේ දේශපාලන මිලිටරි කට්ටුවේ කොටස්කරුවෙකු වූ ජෙනරාල්වරයා, එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්ට සහයෝගය දුන්නේය. ෆොන්සේකා ජය ගතහොත් තම පූර්වගාමියාට ද වඩා බොහෝ දුරකට ඔහු පදනම් වනු ඇත්තේ ද, විධායක ජනාධිපති ක්‍රමයේ අසීමිත බලතල මතය. විශේෂයෙන්ම දැනටමත් පුද්ගලයන් ලක්ෂ තුනක් දක්වා තරවී සිටින හා තවත් තර වෙමින් සිටින මිලිටරිය ඇතුලු රාජ්‍ය යාන්ත්‍රනය හැර ඔහුට වෙනත් ඍජු සහයෝගිතා පදනමක් ඇත්තේ නැත. ජෙනරාල්ගේ දේශපාලන ව්‍යාපාරයේ ප්‍රධාන ගාමකය වන්නේ, සමාජය තුල " නීතිය හා සාමය" ද "විනය" ද තහවුරු කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස රඟපෑමට ෆොන්සේකාට හැකියාව ලැබී ඇත්තේ, එජාපයේ සහයෝගය මතය. එජාපයට එසේ කල හැකිව ඇත්තේ රාජපක්ෂ තන්ත්‍රයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් ලෙස එය හුවාදක්වනු ලබන නව සමසමාජ පක්ෂය (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂය (එසප) වැනි හිටපු රැඩිකලුන්ගේ පිහිටෙනි. මෙම වසර මුල එම සංවිධාන දෙක නිදහසේ වේදිකාව යන ප්‍රෝඩාකාරී නාමයක් යටතේ එජාපය සමඟ අත්වැල් බැඳගත්තේ, දිවයිනේ සිවිල් යුද්ධය ආරම්භ කර පවත්වාගෙන ගිය මෙම දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් ආරක්ෂා කරනු ඇතැයි යන මිත්‍යාව වැඩකරන ජනතාව අතර තොරොම්බල් කරමිනි.

නසසප හා එසප තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයන් ඉදිරිපත් කරමින් ෆොන්සේකාගෙන් දුරස්ථ වීමට උත්සාහ කරයි. එනමුදු, ෆොන්සේකාගේ ව්‍යාපාරයෙහි ප්‍රමුඛ භූමිකාවක් ඉටු කිරීමට ඉඩ සලසමින්, එජාපය ප්‍රජාතන්ත්‍රවාදී සලු පිලි වලින්

සැරසීම සම්බන්ධයෙන් මෙම පක්ෂ දෙක දේශපාලනිකව වගකිව යුතුය. ගිය සතියේ එජාප නායක රනිල් වික්‍රමසිංහ නසසප හා එසප පසුගිය සමයේ තමන්ට දුන් සහායට ප්‍රසිද්ධියේ ම ස්තුති කර ඔවුන්ගේ මැතිවරන ව්‍යාපාරයට සුබපැතුවේ ය. කම්කරු පන්තිය පාලක පන්තියේ ඒ හෝ මේ කන්ඩායමට යටත් කිරීමේ අවස්ථාවාදී දේශපාලනයේ ක්‍රියාකලාපය පිලිබඳව මීටත් වඩා දරුනු චෝදනාවක් තිබිය නොහැකිය.

රටේ ව්‍යසනකාරී විසිහය අවුරුදු සිවිල් යුද්ධයේ අවසානය, මූලික දේශපාලන දිශානතියක් ගැනීමේ ද සමාජවාදී ඉදිරිදර්ශනයක පදනම මත සියලු ධනේශ්වර කන්ඩායම්වලින් ස්වාධීනව බලමුලුගැන්වීමේ ද අවශ්‍යතාව කම්කරු පන්තිය හමුවට ගෙනැවිත් තිබේ. දශක ගනනාවක් තිස්සේ කොලඹ දේශපාලන සංස්ථාපිතය, ධනේශ්වර පාලනය ඔසවා තැබීමටත් කම්කරුවන් වාර්ගික රේඛා ඔස්සේ බෙදීම සඳහාත් දෙමල විරෝධී ස්වෝත්තමවාදය අවුස්සා තිබේ. යුද්ධයේ අවසානය රාජපක්ෂ කියා සිටින පරිදි සාමය හා සෞභාග්‍ය ගෙනැවිත් නැත. ඊට පටහැනිව ගැඹුරු වී ඇත්තේ ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කරන ප්‍රහාරයන් ය.

මෙම ප්‍රශ්න දෙමල කම්කරුවන්ට හා තරුනයන්ට එක එල්ලේ ම මුන ගස්වා තිබේ. එල්ටීටීඊයේ පරාජය හුදෙක් මිලිටරි පරාජයක් නොව, කිසිදු ප්‍රගතිශීලී දේශපාලන හෝ ආර්ථික තර්ක බුද්ධියකින් තොර ඉදිරිදර්ශනයක ප්‍රතිඵලය විය. නිලවශයෙන් ගෙනගිය දෙමල විරෝධී වෙනස්කම් කිරීම්වලට එල්ටීටීඊයේ පිලිතුර වූයේ ශ්‍රී ලංකාව නමැති කුඩා දිවයිනෙහි කොටසක දෙමල සුලුතරය සඳහා වෙනම ධනේශ්වර රාජ්‍යයක් අටවා ගැනීමට උත්සාහ කිරීමයි. සිංහල වැසියන් මත එය එල්ල කල ත්‍රස්තවාදී ප්‍රහාර උපායික වැරදීම් නොවීය. එය වනාහි, කොලඹ ආන්ඩුවල අපරාධ සඳහා පොදුවේ "සිංහල ජනතාවට" චෝදනා කිරීමේ එහි ජාතිකවාදී දෘෂ්ටියේ නිමැවුමක් විය. සිංහල කම්කරුවන් වෙත කිසිදු ආයාචනයක් කිරීමට ඓන්ද්‍රීයවම අසමත් වූ එල්ටීටීඊය, යුද්ධයේ අවසාන මාසවල දී, සියලු ප්‍රමුඛ විදේශ බලවතුන් රාජපක්ෂට සහාය දෙද්දී පවා "ජාත්‍යන්තර ප්‍රජාවට" ශෝචනීය ඉල්ලීම් ඉදිරිපත් කරන තැනට බාල්දුවී ගියේය.

එල්ටීටීඊ දේශපාලන හොරනෑව ලෙස කටයුතු කල දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) යුද්ධය අවසානයේ පටන් වඩ වඩාත් කොලඹ දේශපාලන සංස්ථාපිතයට තුරුලු වෙමින් සිටියි. දෙලක්ෂ පනස්දහසකට වැඩි දෙමල සිවිල් ජනතාවක් රැඳවුම් කඳවුරු තුල ගාල්කර තිබියදී, ඔවුන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කල යුතු යයි ඉල්ලා සිටින කිසිදු උද්ඝෝෂනයක් එය දියත් කර නැත. දැනට ඔවුන් තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන්නේ ද නැත්නම් රාජපක්ෂට හෝ ෆොන්සේකාට සහයෝගය දෙන්නේ ද යන්න ගැන විවාදයක යෙදී සිටින බව වාර්තාවෙයි. ප්‍රතිඵලය කුමක් වුවත්, ටීඑන්ඒ ප්‍රතිපත්ති නියෝජනය කරන්නේ දෙමල ධනපති පන්තියේ උවමනාකම් මිස දෙමල මහජනතාවගේ උවමනාකම් නොවේ. කම්කරු පන්තිය සමග වන ඕනෑම ගැටුමක් හමුවේ කම්කරුවන් මැඩීමේ දී ඔවුන්ගේ ජාතිකත්වය නොසලකා ටීඑන්ඒ නොවරදවා ම ආන්ඩුව සමඟ පෙල ගැසෙනු ඇත.

සසප උද්ඝෝෂනයේ මධ්‍යම ස්ථම්භය වන්නේ ජාත්‍යන්තරවාදයයි. සියලු වර්ගයේ ජාතිකවාදයන් හා වර්ගවාදයන් ප්‍රතික්ෂේප කරන ලෙසටත්, සිය පොදු පන්ති අවශ්‍යතාවයන් සඳහා එකමුතුව සටන් වදින ලෙසටත් අපි කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු. ශ්‍රී ලංකාවේ කම්කරුවන් මුහුනපා සිටින කිසිදු ගැටලුවක් මෙම කුඩා දිවයින මත පදනම්ව විසඳිය නොහැකිය. ගෝලීය ධනවාදය, 1930 ගනන්වලින් මෙපිට ඇතිවූ දරුනුම ආර්ථික අර්බුදයට ලෝකය ඇද දමා තිබේ. ජාතික එදිරිවාදිකම්, මිලිටරිවාදය හා අලුත් යුද්ධ පිලිබඳ තර්ජනය තියුනු කර තිබේ. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ තම සහෝදර පක්ෂ සමඟ එක්ව සසප, අරාජික හා යල් පිනූ ලාභ පද්ධතිය අහෝසි කිරීමටත්, එය සැලසුම්ගත ලෝක සමාජවාදී ආර්ථිකයකින් විස්ථාපනය කිරීමටත්, කම්කරු පන්තිය ජාත්‍යන්තරව එක්සත් කිරීමටත් සටන් කරයි.

පාලක ප්‍රභූ පැලැන්තියේ සියලු කන්ඩායම්වලින් කම්කරු පන්තිය දේශපාලනිකව ස්වාධීන කර ගැනීම සඳහා සසප සටන් වදියි. ධනේශ්වරයේ එක් හෝ අනෙක් දේශපාලන නියෝජිතයාට "අඩු නපුර" ලෙස සලකා සහාය දිය යුතු යයි නසසප හා එසප හිටපු රැඩිකලුන් අතොරක් නැර කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙස අපි කම්කරුවන්ට කියා සිටිමු. තමන්ගේ ම පන්ති අවශ්‍යතාවන් සඳහා සටන් වැදීමට කම්කරු පන්තිය ස්වාධීනව බලමුලුගැන්වීමට පටන් ගන්නා තෙක් ඔවුන්ට, පාලක පන්තිය විසින් පනවන නොඉවසිය හැකි බර පිලිගැනීමට බල කෙරෙනු ඇත. ධනපතියන් අතලොස්සකගේ ලාභය නොව වැඩ කරන ජනතාවගේ දැවෙන අවශ්‍යතා ඉටු කල හැකි සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කල හැකි හා සියල්ලන්ට ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහතික කල හැකි අත්‍යවශ්‍ය පියවර ගත හැක්කේ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ' ආන්ඩුවකට පමනි. දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සසප සටන් වදියි.

සසප අපේක්ෂක විජේ ඩයස්, තම සම්පූර්න වැඩිහිටි ජීවිතය ම කැපකර ඇත්තේ ශ්‍රී ලංකාව තුලත් ජාත්‍යන්තරවත් සමාජවාදය සඳහා මූලධර්මාත්මක අරගලයක් ගෙනයාම උදෙසාය. ඔහු 1968 දී පිහිටුවූ, සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක සාමාජිකයෙකු වන අතර, 1987 දී කීර්ති බාලසූරියගේ අකල් මරනයෙන් පසුව එහි ප්‍රධාන ලේකම් බවට පත්විය. ඔහු ලෝක *සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකි.

සසප සිය ඉදිරිදර්ශනය හා ක්‍රියාමාර්ගය විස්තර කරන මැතිවරන ප්‍රකාශයක් නිකුත් කරනු ඇත. අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගීවීමෙන් ද විජේ ඩයස් අමතන රැස්වීම් ගොඩනැගීමෙන් ද අපගේ ප්‍රකාශන බෙදාහැරීමට උදව් කිරීමෙන් ද මැතිවරන අරමුදලට ත්‍යාගශීලීව මුදලින් ආධාර කිරීමෙන් ද මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාකාරී ලෙස සහයෝගය දෙන මෙන් අපි කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටිමු. අන් සියල්ලටත් වඩා අපගේ දේශපාලන ක්‍රියාමාර්ගයට එකඟ වන සියලු දෙනාගෙන් අප උදක්ම ඉල්ලා සිටින්නේ සසපට බැඳී එය ගොඩනඟන ලෙසයි.